# ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදි සමාජවාදී ජනරජයේ අංක 843/4 දරණ 1994.10.31 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය සහ ඉන්පසු වරින් වර කරනු ලැබූ සංශෝධනයන් වෙනුවට 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන සේ ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථාව නැවත සංශෝධනය කිරීම අමාත්‍ය මණ්ඩලය විසින් ....................... දින අනුමත කරන ලද අතර එම සංශෝධන සහිත ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය පහත දක්වනු ලැබේ.

.......................................
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

.................................... දින
බත්තරමුල්ල.
පැලවත්ත
"ඉසුරුපාය",
අධ්‍යාපන අමාත්‍යාංශයේදිය.

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව: යොමු අංකය:.......................... දිනය........................

1.2 අමාත්‍යාංශය: යොමු අංකය:........................... දිනය......................

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම:

යොමු අංකය:.................... දිනය: ...............................

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය:

යොමු අංකය:........................ දිනය........................

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය:

යොමු අංකය:........................ දිනය...........................

02. ක්‍රියාත්මක වන දිනය

1994.10.31 දිනැති අංක 843/4 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය පරිදි, අංක 865/3 හා 1995.04.03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ හා අංක 966/5 හා 1997.03.11 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ සහ අංක 975/6 හා 1997.05.14 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, වරින්වර සංශෝධනය වූ හා 1994.10.06 සිට ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය වෙනුවට මෙම "ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය" 2008.07.01 දින සිට ක්‍රියාත්මක වූයේ යැයි සැළකිය යුතුය.

03. සේවාවේ පොදු කාර්ය භාරය

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව රජයේ පාසල්වල ඉගැන්වීම් කාර්යයන්, පාසල් අධ්‍යාපනයට අදාළ ජාතික මට්ටමේ හා අනෙකුත් විභාග පැවැත්වීමට අදාළ කාර්යයන්, පාසල්වල ක්‍රීඩා හා අනෙකුත් විෂයය සමගාමී කාර්යයන් සහ රජය විසින් පාසල් මට්ටමින් ක්‍රියාත්මක කළ යුතු යැයි තීරණය කරනු ලබන කාර්යයන් ගුරුවරුන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් විසින් ඉටු කළ යුතු වේ.

04. අර්ථ නිරූපන / නිර්වචන

4.1 **"ව්‍යවස්ථාව"** යනුවෙන් ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය අදහස් කෙරේ.

4.2 **"සභාව"** යනුවෙන් මධ්‍යම රජය සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද / පළාත් රාජ්‍ය සේවය සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද යන්න අදහස් කෙරේ.

4.3 **"පත්වීම් බලධාරියා"** යනු රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරා ඇති නිලධාරියෙකු හෝ පළාත් රාජ්‍ය සේවයට බඳවාගනු ලබන ගුරුවරුන් පිළිබඳව අදාළ පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවරයා හෝ ආණ්ඩුකාරවරයා විසින් බලය පවරා ඇති නිලධාරියෙකු වේ.

4.4 වෙනත් අයුරකින් සුවිශේෂ කොට සඳහන් කර නැත්නම් **"සේවය"** යනුවෙන් ශ්‍රී ලංකා ගුරු සේවය අදහස් කෙරේ.

4.5 **"අමාත්‍යාංශය"** යනුවෙන් සාමාන්‍ය අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශය හෝ පළාත් රාජ්‍ය සේවයට අදාළව අදාළ පළාත් සභාවේ අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය අදහස් කෙරේ.

4.6 **"අධීක්ෂණ නිලධාරියා"** යන්නෙන් නිසි හා විධිමත් අධීක්ෂණය පවත්වා ගැනීම සඳහා සම්පාදිත රීති සහ නියෝග ප්‍රකාරව පත් කරනු ලැබූ රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ / පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ / පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් බලය පැවරූ අධීක්ෂණ මට්ටමේ නිලධාරියෙකු වේ.

4.7 **"උපාධිධාරී"** යනුවෙන් අදහස් කරන්නේ, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගුරු පත්වීම් වලට අදාළව පිළිගත් සුවිශේෂී කරන ලද විෂය ක්ෂේත්‍රවලට අයත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ ලබා ගත් උපාධි සුදුසුකම් සහතිකය ඇත් පුද්ගලයෙකු වේ.

4.8 **"අධ්‍යාපනවේදී උපාධිධාරීන්"** යනුවෙන් අදහස් කරන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ ලබාගත් අධ්‍යාපනවේදී සුදුසුකම් සහතිකයක් ඇත් පුද්ගලයෙකුවේ.

4.9 **" ගුරු පුහුණුව ලද තැනැත්තා"** යනුවෙන් අදහස් කරන්නේ;

(අ) අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද දෙවසරකට නො අඩු වූ ආයතනික ගුරු පුහුණු පාඨමාලාවක්

හෝ

(ආ) අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද හා දුරස්ථ ක්‍රමය මගින් තෙවසරකට නො අඩු ගුරු පුහුණු පාඨමාලාවක්

හෝ

සාර්ථක ලෙස සම්පූර්ණ කර සහතික පත්‍රය ලද පුද්ගලයෙකු වේ.

4.10 **"ශික්ෂණ විද්‍යා පුහුණුව ලද උපාධිධාරීන්"** යනුවෙන් අදහස් කරන්නේ;

(i) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සුදුසුකම් ඇත් හා 4.7 හි විස්තර කරන ලද උපාධිධාරීන්

හෝ

(ii) ඉහත 4.8 හි සඳහන් සුදුසුකම ලබා ඇති උපාධිධාරීන් වේ.

හෝ

(iii) ඉහත 4.9 හි සඳහන් සුදුසුකම් ලබා ඇති. 4.7 හි විස්තර කරන ලද උපාධිධාරීන් වේ.

4.11 **"ඩිප්ලෝමාධාරී"** යනුවෙන් අදහස් කරන්නේ 4.10 හි සඳහන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් නොවන්නා වූ ද, අදාළ කාරණය සඳහා රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන ආයතනයක් විසින් පිරිනමනු ලබන්නා වූ ද, දෙවසරකට නො අඩු පාඨමාලා කාල පරාසයක් සහිත වූ ද, ජාතික වෘත්තීය කුසලතා මට්ටම් **5** ට නොඅඩු තරාතිරමක වූ ද, ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා සම්පූර්ණ කර සහතික පත් ලද පුද්ගලයෙකු වේ.

4.12 **"පුහුණු ඩිප්ලෝමාධාරින්"** යනුවෙන් අදහස් කරන්නේ 4.11 හි සඳහන් ඩිප්ලෝමා පාඨමාලාවක් සහ 4.9 හි සඳහන් ගුරු පුහුණු පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා සම්පූර්ණ කර සහතික පත් ලද තැනැත්තෙකු වේ.

4.13 **" අ.පො.ස. (උසස් පෙළ) සුදුසුකම් ලත් තැනැත්තා"** යනුවෙන් අදහස් කරන්නේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් තුනක් එකවර සමත් වූ පුද්ගලයෙකු වේ.

4.14 **"පශ්චාත් උපාධියක්"** යනුවෙන් අදහස් කරන්නේ 4.7 ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමෙන් පසු එකී උපාධි පාඨමාලාවට අන්තර්ගත විෂයයකට හෝ විෂයයන්ට අදාළව ලබා ගන්නා පශ්චාත් උපාධිය වේ.

4.15 **"පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සුදුසුකම"** යනුවෙන් අදහස් කරන්නේ 4.7 හි සඳහන් සුදුසුකම් ලැබීමෙන් පසු ලබා ගන්නා අධ්‍යාපනය විෂයය පිළිබඳ වූ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සහතිකයක් වේ.

4.16 **"ලේකම්"** යනුවෙන් අදහස් කරන්නේ අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හෝ අදාළ පළාත් සභාවේ අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වේ.

## 05. පත්කිරීම් බලධාරියා

රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ පළාත් රාජ්‍ය සේවයට අදාළව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරා ඇති නිලධාරියෙකු වේ.

## 06. පරිපාලන බලධාරියා

සාමාන්‍ය අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ලේකම්වරයා විසින් බලය පවරා ඇති නිලධාරියෙකු හෝ පළාත් රාජ්‍ය සේවය පිළිබඳව අදාළ පළාත් සභාවේ අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ලේකම් වරයා විසින් බලය පවරා ඇති නිලධාරියෙකු වේ.

## 07. සේවාවට අයත්වන නිලධර ගණයන්

7.1 **නිලධර ගණය:** ශ්‍රී ලංකා ගුරු සේවය (ශ්‍රී.ලං.ගු.සේ)

7.2 **ශ්‍රේණි:**

2 වන පන්තියේ II ශ්‍රේණිය

2 වන පන්තියේ I ශ්‍රේණිය

1 වන පන්තිය

යන ව්‍යුහගත ඒකාබද්ධ පන්ති හා ශ්‍රේණිවලින්ද තේරීම් ශ්‍රේණිය වූ අධි ශ්‍රේණියෙන්ද සමන්විත වේ.

**අධි ශ්‍රේණිය:**

අධි ශ්‍රේණිය පහත සඳහන් තනතුරු දරන්නන් ගෙන් සමන්විත වේ.

(අ) ගුරු උපදේශක තනතුරු

(ආ) පාසල් වල අංශ භාර ප්‍රධානී තනතුරු

**සටහන:**

සේවයට බඳවා ගැනීම ශික්ෂණ විද්‍යා පුහුණුව ලද උපාධිධාරීන්ට පමණක් සීමා කෙරෙන අතර, ඒ අනුව බඳවා ගැනීමේ ශ්‍රේණිය වනුයේ 2 වන පන්තියේ II ශ්‍රේණියයි.

08. **තනතුරේ ස්වභාවය:** ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

09. **වැටුප**

9.1 **වැටුප් කේත අංක:** ව්‍යුහගත ශ්‍රේණි:- ජී. ඒ. 2-2006

අධි ශ්‍රේණිය :- ජී. ඒ. 3-2006

9.2 **වැටුප් පරිමාණය**

**ව්‍යුහගත ශ්‍රේණි:** රු.16,100-240 x 5-330 x 5-400 x 7-645 x 20-34,650

**අධි ශ්‍රේණිය** : රු.22,100-645 x 11-790 x 13-39,465

9.3 **ශ්‍රේණි ක්‍රමය හා අදාළ ආරම්භක වැටුප් පියවර:**

| **ශ්‍රේණිය** | **වැටුප් පියවර** | **වැටුප් තලය** |
|---|---|---|
| 2-II ශ්‍රේණිය | පියවර 01 | රු. 16,100/- |
| 2-I ශ්‍රේණිය | පියවර 11 | රු. 18,950/- |
| I පන්තිය | පියවර 18 | රු. 21,750/- |
| අධි ශ්‍රේණිය | පියවර 01 | රු. 22,100/- |

**සටහන:**

I. එක් ශ්‍රේණියක/පන්තියක සිට ඊළග ශ්‍රේණියට/පන්තියට උසස් කරනු නො ලැබුව හොත් උසස්වීම් ශ්‍රේණියට/පන්තියට හිමි වැටුප් පියවර සඳහා හිමිකම් නොලැබෙන අතර අංක 06/2006 (viii) වැටුප් වගුවල 2-II හා 2-I ශ්‍රේණි වලට අදාලව දැක්වෙන, ඊළග ශ්‍රේණියට / පන්තියට උසස් නොවුයේ නම් නියම කර ඇති අවසන් වැටුප් පියවර දක්වා පමණක් එම වැටුප් පරිමාණ ක්‍රියාත්මක සේ සැලකේ.

II. සේවයේ 2-II ශ්‍රේණියට බඳවා ගැනීමේදී වැටුප් පරිමාණයේ පිහිටුවීම:

(අ) ඉහත 4.10 (ii)හි හා 4.10හි (iii)හි සඳහන් සුදුසුකම් ලද තැනැත්තන් 2-II ශ්‍රේණියේ වැටුප් බණ්ඩයේ 2 වන වැටුප් පියවරට ද ඉහත 4.10 (i)හි සඳහන් සුදුසුකම් ලද තැනැත්තන් 2-II ශ්‍රේණියේ වැටුප් බණ්ඩයේ 3 වන වැටුප් පියවරට ද තබනු ලැබේ.

(ආ) ප්‍රථම උපාධිය, විෂය බද්ධ පශ්චාත් උපාධිය සහ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් සහිත උපාධිධාරීන් බඳවා ගනු ලැබීමේදී 2-II ශ්‍රේණියේ වැටුප් බණ්ඩයේ 4 වන පියවරේ තබනු ලැබේ.

10. **අනුමත නිලධර සංඛ්‍යාව : 1,97,279**

10.1 **සේවක සංඛ්‍යාව**

සේවයෙහි මුළු සේවක සංඛ්‍යාව ව්‍යුහගත ශ්‍රේණි සම්බන්ධයෙන් වන කළ 2-II, 2-I ශ්‍රේණි හා 1 වන පන්තිය සඳහා අනුමත සමස්ථ සේවක සංඛ්‍යාව විය යුතු අතර, අධි ශ්‍රේණිය සඳහා සේවක සංඛ්‍යාව එම ශ්‍රේණිය වෙනුවෙන් අනුමත සේවක සංඛ්‍යාව විය යුතුය.

10.2 පාසල් හා ශිෂ්‍ය සංඛ්‍යාව වෙනස්වීම් වලට අනුරූපීව අනුමත නිලධාරි සංඛ්‍යාව කලින් කල සංශෝධනයට භාජනය වනු ඇත.

11. **සේවාවට අයත් තනතුරු**

11.1 **අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්:**

| **අනුමත තනතුරු නාමය** | **අනුමත ඒකාබද්ධ තනතුරු සංඛ්‍යාව** | **කාර්යයන්** |
|---|---|---|
| ගුරු සේවයේ 2-II, 2-I, 1 | **184605** | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව රජයේ පාසල්වල ඉගැන්වීම් කාර්යයන්, පාසල් අධ්‍යාපනයට අදාළ ජාතික මට්ටමේ හා අනෙකුත් විභාග පැවැත්වීමට අදාළ කාර්යයන්, පාසල්වල ක්‍රීඩා හා අනෙකුත් විෂයය සමගාමී කාර්යයන් සහ රජය විසින් පාසල් මට්ටමින් ක්‍රියාත්මක කළ යුතු යැයි තීරණය කරනු ලබන කාර්යයන් ඉටු කිරීම. |
| අධි ශ්‍රේණිය<br>ගුරු උපදේශක | **3379** | ගුරුවරන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ඔවුන්ට සහාය වීම, විෂයමාලා ක්‍රියාත්මක කිරීමේදී හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී, ගුරුවරුන්ට උපදේශනය සැපයීමත්, එම කටයුතු ගුණාත්මක බවකින් ඉටු කිරීමටත් නියාමකයෙකු වීම. |
| අධි ශ්‍රේණිය<br>අංශ භාර ප්‍රධානී තනතුර | **9295** | පාසල තුළ ක්‍රියාත්මක වන සමස්ථ ක්‍රියාවලිය තම අංශය තුළ විධිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා විද්‍යාලයීය පරිපාලනයට සම්බන්ධීකාරකයෙකු ලෙස සහාය වීම. |

**සටහන:** මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට අදාළ සුදුසුකම් සම්පූර්ණ කිරීම මත ගුරු උපදේශක වශයෙන් පත් කරන සංඛ්‍යාවට පමණක් ගුරු උපදේශක තනතුරු සීමා වන අතර ඉන් අනතුරුව ගුරු උපදේශකවරුන් බඳවා ගනු නොලැබේ.

## 12. බඳවා ගැනීමේ ක්‍රමය:

### 12.1 බඳවා ගන්නා අනුපාතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100 % |
| සීමිත | අදාළ නැත |

### 12.2 විවෘත බඳවා ගැනීම

**12.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය: 2-II ශ්‍රේණිය**

**12.2.1.1 සුදුසුකම්:**

**12.2.1.1.1 අධ්‍යාපන සුදුසුකම්:**

i. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් මව් භාෂාව හා ගණිතය ඇතුළුව එක් වරකදී විෂයයන් පහක් සහිතව දෙවාරයකට නොවැඩි වාර ගණනකදී විෂයන් (හයක්) 06 සමත් වීම හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් අ.පො.ස. (සා.පෙළ) හා සම තත්ත්වයේ සලකනු ලබන සුදුසුකමක් ලබා තිබීම ද.

ii. අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් විෂයයන් 03 කින් සමත් වීම

සමග

iii. ශික්ෂණ විද්‍යා පුහුණුව ලද උපාධිධාරියෙකු වීම.

**12.2.1.1.2 වෘත්තීය සුදුසුකම්:** ඉහත iii හි සඳහන් පරිදි

**12.2.1.1.3 පළපුරුද්ද:** අදාළ නොවේ

**12.2.1.1.4 කායික සුදුසුකම් :**

I. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

II. තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**12.2.1.1.5 වෙනත්**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම හා පළාත් රාජ්‍ය සේවය පිළිබඳව අදාළ පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු වීම.

II. අයැදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින්ද යුක්ත වීම

III. රාජ්‍ය සේවයෙන් පහ කළ අයෙකු හෝ රාජ්‍ය සේවය අවසන් කළ අයෙකු හෝ රාජ්‍ය සේවයේ තනතුර හැර ගිය අයෙකු නොවිම

IV. සුදුසුකම් ලබන දිනය - ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට / සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයැදුම්කරු, ඉහත 12.2.1.1 වන ඡේදයේ සඳහන් අවශ්‍ය සුදුසුකම් අයැදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයැදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

12.2.1.2 **වයස:**

12.2.1.2.1 **අවම සීමාව :** අවුරුදු 18

12.2.1.2.2 **උපරිම සීමාව:** අවුරුදු **35**

12.2.1.3 **බඳවා ගැනීමේ ක්‍රමය:**

සේවයට බඳවා ගැනීම පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන පරිදි, ඒ වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තරග විභාගයක හා/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හෝ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මත සිදු කරනු ලැබේ.

පාසල් පද්ධතියේ අවශ්‍යතාවය මත සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන් අනුව වෙන වෙනම බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

12.2.1.3.1 **ලිඛිත විභාගය : ( 'අ' පරිශිෂ්ඨය බලන්න)**

| **විෂයයන්** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **සමත් ලකුණු ප්‍රමාණය (අවම)** |
|---|---|---|
| අභියෝග්‍යතාව (කාලය පැය 01යි) | 100 යි | 40 යි |
| සාමාන්‍ය දැනීම (කාලය පැය 01යි) | 100 යි | 40 යි |

12.2.1.3.1.1 **පවත්වන බලධරයා :** විභාග කොමසාරිස් ජනරාල්

12.2.1.3.2 **වෘත්තීය පරීක්ෂණය:** අදාළ නොවේ

12.2.1.3.2.1 **පවත්වන බලධරයා :** අදාළ නොවේ

12.2.1.3.3 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :** ලකුණු ලබා දෙනු ලැබේ

**ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු:**

මෙහිදී තමන් අයැදුම් කරන විෂය ක්ෂේත්‍රයට අදාළව ඉගැන්වීමේ කුසලතාව පරීක්ෂා කරන අතර ඒ සඳහා ලකුණු **50** ක් පිරිනැමේ.

12.2.1.3.3.1 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය**

**පත් කරන බලධරයා :** පත්වීම් බලධාරියාම වේ

12.2.1.3.4. **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:** ලකුණු ලබා දෙනු නොලැබේ

**ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු:**

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

12.2.1.3.4.1 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය**

**පත්කිරීමේ බලධරයා:** පත්වීම් බලධාරියාම වේ

**සටහන:**

සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අයැදුම්කරුවන් සංඛ්‍යාව, අවස්ථාවෝචිත පරිදි ලිඛිත විභාගයේදී ඔවුන් විසින් ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ හා අදාළ පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත් කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. තෝරා ගැනීම 'අ' පරිශිෂ්ඨය අනුව සිදු කරනු ලැබේ.

12.2.1.4 **අයැදුම්පත් කැඳවීමේ ක්‍රමය :** රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම මගින් හෝ රජයේ පුවත්පත් දැන්වීමක් මගින්

### 12.2.2 අධි ශ්‍රේණියට බඳවා ගැනීම

12.2.2.1 අධි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය සඳහා පෙනී සිටීමට සම්පූර්ණ කළ යුතු මූලික සුදුසුකම්.

(i) ශ්‍රී ලංකා ගුරු සේවයේ 2-I ශ්‍රේණියේ වසර හයක (06) ක සතුටුදායක සේවා කාලයක් ඇති 2-I ශ්‍රේණියේ ගුරුවරයෙකු හෝ 1 වන පන්තියේ ගුරුවරයෙකු විය යුතුය.

(ii) 2-I ශ්‍රේණිය සඳහා නියමිත කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාව වූ දෙවන සේවාස්ථ පුහුණුව සම්පූර්ණ කර තිබිය යුතුය.

(iii) වෘත්තිය සමාලෝචනය ද ඇතුලුව අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව අයැදුම්කිරීමට සුදුසුකම් ලබන දිනයට පූර්වාසන්න වූ වසර පහ (05) තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිය යුතුය.

(iv) අධි ශ්‍රේණියේ අනුමත පුරප්පාඩු තනතුරු සංඛ්‍යාවෙන් 60% ක් විභාග ප්‍රතිඵල මත බඳවා ගන්නා අතර 40% ක් සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 1 පන්තියේ වසර දහයකට (10) නොඅඩු සතුටුදායක සේවා කාලයක් හා වැටුප් වර්ධක උපයාගෙන ඇති සහ III වන කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවය සම්පූර්ණ කර ඇති අය අතුරින් ජ්‍යෙෂ්ඨතාවය අනුව උසස් කිරීමෙන් බඳවා ගනු ලැබේ.

**12.2.2.2 වෙනත්**

(i) සුදුසුකම් ලබන දිනය - අධි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයැදුම්කරු. ඉහත 12.2.2.1 වන ඡේදයේ සඳහන් අවශ්‍ය සුදුසුකම් අයැදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයැදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

**12.2.2.3 බඳවා ගැනීමේ ක්‍රමය**

**12.2.2.3.1 ලිඛිත විභාගය ("ආ" පරිශිෂ්ඨය)**

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය (අවම) |
|---|---|---|
| (01) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ව්‍යුහය හා තුලනාත්මක අධ්‍යාපනය (කාලය පැය 02 යි) | 100 යි | 40 යි |
| (02) නූතන අධ්‍යාපන ව්‍යවහාර (කාලය පැය 02 යි) | 100 යි | 40 යි |
| (03) ප්‍රායෝගික අධ්‍යාපන මනෝවිද්‍යාව හා ශිෂ්‍ය උපදේශනය (කාලය පැය 02 යි) | 100 යි | 40 යි |

12.2.2.3.1.1 **පවත්වන බලධරයා:** විභාග කොමසාරිස් ජනරාල්

**12.2.2.3.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය** : ලකුණු ලබා දෙනු නොලැබේ

**ඉටු කරවා ගැනීමට අපේක්ෂිත අරමුණු:**

සේවා ව්‍යස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි තහවුරු කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

**සටහන:**

(i) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අයැදුම්කරුවන් සංඛ්‍යාව අවස්ථාවෝචිත පරිදි ලිඛිත විභාගයේදී ඔවුන් විසින් ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ හා අදාළ පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින් තෝරා ගනු ලබන්නේ විභාගයෙන් ඉහළම ලකුණු ලබා ඇති කුසලතා අනුපිළිවෙළ අනුවය.

(ii) මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ගුරු උපදේශකවරුන් බඳවා ගැනීම සඳහා පවත්වන ලද විධිමත් තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගෙන ඇති තැනැත්තන් තරග විභාගය පිළිබඳ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(iii) අත්‍යාවශ්‍ය විෂයයන් සඳහා ප්‍රමාණවත් ඉල්ලුම්කරුවන් නොමැති අවස්ථාවලදී ගුරු සේවයේ 2-I ශ්‍රේණියේ හෝ තවදුරටත් ප්‍රමාණවත් ඉල්ලුම්කරුවන් නොමැති අවස්ථාවලදී ගුරු සේවයේ 2-II ශ්‍රේණිධාරීන්ටද අධිශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය සඳහා ඉල්ලුම් කිරීමට ඉඩදීම ගැන අදාළ බලධාරියාට ක්‍රියා කළ හැකිය.

## 13. කාර්යක්ෂමතා කඩ ඉම

13.1

| **කාර්යක්ෂමතා කඩඉම** | **ශ්‍රේණිය** | **කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතු කාල සීමාව** | **කාර්යක්ෂමතා කඩඉම වශයෙන් පැවැත්වෙන සේවාස්ථ පුහුණුව සඳහා වූ කාල පරාසය** |
|---|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | අන්තර්කාලීන ශ්‍රේණි:<br>1. **3-1 (ඇ)** | **3-1**(ඇ) ශ්‍රේණියට බඳවා ගැනීමේ සිට වසර හත (07) ක් ඉක්ම යාමට පෙර සම්පූර්ණ කළ යුතුය. | දේශන පැය 280 ට නො අඩු |
| | 2. **3-1**(ආ) | **3-1**(ආ) ශ්‍රේණියට බඳවා ගැනීමේ සිට වසර පහ (05) ක් ඉක්ම යාමට පෙර සම්පූර්ණ කළ යුතුය. | දේශන පැය 200 ට නො අඩු |

| | | | |
|---|---|---|---|
| | 3. 3-1(අ)<br><br>2- II ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ:<br>1. ආරම්භක පියවරේ පිහිටුවූවන් සඳහා<br><br>2. දෙවන පියවරේ පිහිටුවූවන් සඳහා<br>3. තුන්වන පියවරේ පිහිටුවූවන් සඳහා<br><br>4. හතරවන පියවරේ පිහිටුවූවන් සඳහා | 3-1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීමේ සිට වසර දෙක( 02) ක් ඉක්ම යාමට පෙර සම්පූර්ණ කළ යුතුය.<br><br>2-II ශ්‍රේණියට බඳවා ගැනීමේ සිට වසර නමය (09) ක් ඉක්ම යාමට පෙර සම්පූර්ණ කළ යුතුය.<br><br>2-II ශ්‍රේණියට බඳවා ගැනීමේ සිට වසර අට (08) ක් ඉක්ම යාමට පෙර සම්පූර්ණ කළ යුතුය.<br>2-II ශ්‍රේණියට බඳවා ගැනීමේ සිට වසර හත (07) ක් ඉක්ම යාමට පෙර සම්පූර්ණ කළ යුතුය.<br><br>2-II ශ්‍රේණියට බඳවා ගැනීමේ සිට වසර හය (06) ක් ඉක්ම යාමට පෙර සම්පූර්ණ කළ යුතුය. | දේශන පැය 80 ට නො අඩු<br><br>දේශන පැය 360 ට නො අඩු<br><br>දේශන පැය 320 ට නොඅඩු<br><br>දේශන පැය 280 ට නො අඩු<br><br>දේශන පැය 240 ට නො අඩු |
| II වන කාර්යක්ෂමතා කඩඉම | 2-I ශ්‍රේණිය | 2-I ශ්‍රේණියට උසස් වී වසර හය (06) ක් ඉක්ම යාමට පෙර සම්පූර්ණ කළ යුතුය. | දේශන පැය 240 ට නො අඩු |
| III වන කාර්යක්ෂමතා කඩඉම | I වන පන්තිය / අධි ශ්‍රේණිය | I වන පන්තියට හෝ අධි ශ්‍රේණියට පත් වී වසර පහ (05) ක් ඉක්ම යාමට පෙර සම්පූර්ණ කළ යුතුය | දේශන පැය 200 ට නො අඩු |

### 13.2 සේවාස්ථ පුහුණු පාඨමාලා කාලය

ඉහත දක්වා ඇති එක් එක් ශ්‍රේණියක/ පන්තියක සිට ඊළඟ ශ්‍රේණියට / පන්තියට උසස් වීම් සඳහා නියම කර ඇති සේවාස්ථ පුහුණු පාඨමාලා කාලසීමාව නියමිත පරිදි සම්පූර්ණ කළ යුතුය. නමුත් සේවයේ 2-II ශ්‍රේණියට උසස් කරනු ලැබීමෙන් පසු 2-I ශ්‍රේණියේ හෝ 1 වන පන්තියේ හෝ සේවා කාලය තුළ උපාධි සුදුසුකම් ලබා ගන්නා පුහුණු ගුරුවරුන් සම්බන්ධයෙන්ද, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සුදුසුකම් ලබා ගන්නා ශික්ෂණ විද්‍යාත්මක පුහුණුව නොලද උපාධිධාරීන් සම්බන්ධයෙන්ද විෂය බද්ධ පශ්චාත් උපාධි ලබා ගන්නා උපාධිධාරීන් සම්බන්ධයෙන් ද ඒ ඒ ශ්‍රේණියට අදාළ සේවාස්ථ පුහුණු පාඨමාලාවේ කාල සීමාව හරි අඩකින් අඩු කෙරේ.

## 14. ශ්‍රේණිගතව උසස් කිරීම

ශ්‍රී ලංකා ගුරු සේවයේ 2-II ශ්‍රේණියේ සිට ඉහළට සියලුම ගුරුවරුන් උසස් කිරීමේ කාර්යය සඳහා පහත සඳහන් විශේෂ විධිවිධානයන්ට යටත්ව සමාන තත්ත්වයේ ලා සළකනු ලැබේ. මෙම විධිවිධාන දැනට සේවයේ යෙදී සිටින්නන් 2-II ශ්‍රේණියට පත්වීමෙන් හෝ උසස් කරනු ලැබීමෙන් පසු ඒ අයුරින්ම ඔවුන් සඳහා ද අදාළ වනු ඇත.

### 14.1 2-II ශ්‍රේණියේ සිට 2-I ශ්‍රේණියට උසස් කිරීම

මෙම උසස් කිරීමේ ක්‍රියාවලිය කොටස් හතරකට වර්ග කෙරේ. එම උසස් කිරීමේ ක්‍රියාවලිය 14.1.1, 14.1.2, 14.1.3, 14.1.4 වශයෙන් පහත දැක්වේ.

14.1.1 සේවයේ 3-I ශ්‍රේණියේ සිට 2-II ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ පිහිටුවා උසස් කරනු ලබන්නන් 2-II ශ්‍රේණියේ සිට 2-I ශ්‍රේණියට උසස් කිරීම.

#### 14.1.1.1 උසස්වීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා

i. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට 2-II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නමයක් (09) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නමයක් (09) ක් උපයා ගෙන තිබීම.

ii. පළමු කාර්යක්ෂමතා කඩඉම වශයෙන් දේශන පැය 360 කට හෝ මාස තුනකට නො අඩු සේවාස්ථ පුහුණුවක් සේවයේ 2–II ශ්‍රේණියේ සේවා කාලය වසර නමයක් (09) ගතවීමට පෙර සම්පූර්ණ කර තිබීම.

iii. වෘත්තීය සමාලෝචනය ද ඇතුලුව අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වූ වසර නමයක් (09) තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වූ වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. ගුරු සේවයේ පත්වීම ස්ථිර කර තිබීම.

vi. පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන්නෙකුට එක් වරක් පමණක් පෙනී සිටිය හැකි ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වීමෙන්, එම අවශ්‍යතා සම්පූර්ණ කර ඇති දින සිට 2-II ශ්‍රේණියේ සිට 2-I ශ්‍රේණියට උසස් වීම සඳහා සුදුසුකම් ලැබූ සේ සැලකේ.

- 2-II ශ්‍රේණියේ වසර හයක (06) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලයට අදාළ වැටුප් වර්ධක උපයාගෙන තිබීම
- එකී සේවා කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් වශයෙන් පැය 240ට නොඅඩු සේවාස්ථ පුහුණුවක් සම්පූර්ණ කර තිබීම

- එකී සේවා කාලය තුළ වෘත්තිය සමාලෝචනය ඇතුළුව සතුටුදායක කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

- උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

- ගුරු සේවයේ පත්වීම ස්ථිර කර තිබීම

  (විභාග ක්‍රමවේදය 17.2 වගන්තිය යටතේ සඳහන් වේ.)

14.1.2 ගුරු පුහුණුව සමග උපාධි සුදුසුකම් මත 2-II ශ්‍රේණියට නියමිත වැටුප් ක්‍රමයේ දෙවන පියවරට බඳවා ගත් 2-II ශ්‍රේණියේ ගුරුවරුන් 2-I ශ්‍රේණියට උසස් කිරීම.

14.1.2.1 **උසස්වීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා**

i. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්නතම සේවයේ 2-II ශ්‍රේණියේ අවම වශයෙන් වසර අට (08) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක අට (08) ක් උපයා ගෙන තිබීම.

ii. පළමු කාර්යක්ෂමතා කඩඉම වශයෙන් දේශන පැය 320 කට හෝ මාස තුනකට නො අඩු සේවාස්ථ පුහුණුවක් සේවයේ 2–II ශ්‍රේණියේ සේවා කාලය වසර අට (08) ක් අවසන්වීමට පෙර සම්පූර්ණ කර තිබීම.

iii. වෘත්තිය සමාලෝචනය ද ඇතුළුව අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වූ වසර අට (08) ක් තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වූ වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. ගුරු සේවයේ පත්වීම ස්ථිර කර තිබීම.

vi. පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන්නෙකුට එක් වරක් පමණක් පෙනී සිටිය හැකි ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වීමෙන්, එම අවශ්‍යතා සම්පූර්ණ කර ඇති දින සිට 2-II ශ්‍රේණියේ සිට 2-I ශ්‍රේණියට උසස් වීම සඳහා සුදුසුකම් ලැබූ සේ සැලකේ.

  - 2-II ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලයට අදාළ වැටුප් වර්ධක උපයාගෙන තිබීම

  - එකී සේවා කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් පැය 200ට නොඅඩු සේවාස්ථ පුහුණුවක් සම්පූර්ණ කර තිබීම

- එකී සේවා කාලය තුළ වෘත්තිය සමාලෝචනය ඇතුලුව සතුටුදායක කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

- උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

- ගුරු සේවයේ පත්වීම ස්ථිර කර තිබීම

  (විභාග ක්‍රමවේදය 17.2 වගන්තිය යටතේ සඳහන් වේ.)

**14.1.3** උපාධිය සමග පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව හෝ අධ්‍යාපනවේදී උපාධිය සුදුසුකම් මත 2-II ශ්‍රේණියට නියමිත වැටුප් ක්‍රමයේ තුන්වන පියවරට බඳවා ගත් 2-II ශ්‍රේණියේ ගුරුවරුන් 2-I ශ්‍රේණියට උසස් කිරීම.

**14.1.3.1 උසස්වීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා**

i. උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්නතම සේවයේ 2-II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හත (07) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හත (07) ක් උපයා ගෙන තිබීම.

ii. පළමු කාර්යක්ෂමතා කඩඉම වශයෙන් දේශන පැය 280 කට හෝ මාස තුනකට නො අඩු සේවාස්ථ පුහුණුවක් සේවයේ 2–II ශ්‍රේණියේ වසර හත (07) ක් අවසන් වීමට පෙර සම්පූර්ණ කර තිබීම.

iii. වෘත්තිය සමාලෝචනය ද ඇතුලුව අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වූ වසර හත (07) ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වූ වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. ගුරු සේවයේ පත්වීම ස්ථිර කර තිබීම.

vi. පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන්නෙකුට එක් වරක් පමණක් පෙනී සිටිය හැකි ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වීමෙන්, එම අවශ්‍යතා සම්පූර්ණ කර ඇති දින සිට 2-II ශ්‍රේණියේ සිට 2-I ශ්‍රේණියට උසස් වීම සඳහා සුදුසුකම් ලැබූ සේ සැලකේ.

- 2-II ශ්‍රේණියේ වසර හතරක (04) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලයට අදාළ වැටුප් වර්ධක උපයාගෙන තිබීම

- එකී සේවා කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් පැය 160ට නොඅඩු සේවාස්ථ පුහුණුවක් සම්පූර්ණ කර තිබීම

- එකී සේවා කාලය තුළ වෘත්තිය සමාලෝචනය ඇතුලුව සතුටුදායක කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

- උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට අදාළ කාලය තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

- ගුරු සේවයේ පත්වීම ස්ථිර කර තිබීම

  (විභාග ක්‍රමවේදය 17.2 වගන්තිය යටතේ සඳහන් වේ.)

14.1.4 ප්‍රථම උපාධිය, සහ පශ්චාත් උපාධියක් සමග පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සුදුසුකම් / ගුරු පුහුණුව මත 2-II ශ්‍රේණියට නියමිත වැටුප් ක්‍රමයේ හතරවන පියවරට බඳවා ගත් 2-II ශ්‍රේණියේ ගුරුවරුන් 2-I ශ්‍රේණියට උසස් කිරීම.

14.1.4.1 **උසස්වීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා**

i. උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනට 2-II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (06) ක් උපයා ගෙන තිබීම.

ii. පළමු කාර්යක්ෂමතා කඩඉම වශයෙන් දේශන පැය 240 කට හෝ මාස තුනකට නො අඩු සේවාස්ථ පුහුණුවක් සේවයේ 2-II ශ්‍රේණියේ වසර හය (06) ක් අවසන්වීමට පෙර සම්පූර්ණ කර තිබීම.

iii. වෘත්තිය සමාලෝචනය ද ඇතුලුව අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වූ වසර හය (06) ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වූ වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. ගුරු සේවයේ පත්වීම ස්ථිර කර තිබීම.

vi. පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන්නෙකුට එක් වරක් පමණක් පෙනී සිටිය හැකි ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වීමෙන්, එම අවශ්‍යතා සම්පූර්ණ කර ඇති දින සිට 2-II ශ්‍රේණියේ සිට 2-I ශ්‍රේණියට උසස් වීම සඳහා සුදුසුකම් ලැබූ සේ සැලකේ.

- 2-II ශ්‍රේණියේ වසර තුනක (03) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලයට අදාළ වැටුප් වර්ධක උපයාගෙන තිබීම

- එකී සේවා කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් පැය 120ට නොඅඩු සේවාස්ථ පුහුණුවක් සම්පූර්ණ කර තිබීම

- එකී සේවා කාලය තුළ වෘත්තිය සමාලෝචනය ඇතුලුව සතුටුදායක කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

- උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට අදාළ කාලය තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

- ගුරු සේවයේ පත්වීම ස්ථිර කර තිබීම

  (විභාග ක්‍රමවේදය 17.2 වගන්තිය යටතේ සඳහන් වේ.)

14.1.5 **උසස් කිරීමේ ක්‍රමය**

14.1.5.1 **සාමාන්‍ය විධිවිධාන යටතේ**

සුදුසුකම් සම්පූර්ණ කරන ගුරුවරුන් 2-I ශ්‍රේණියට උසස් කිරීම සඳහා විදුහල්පති මගින් කොට්ඨාශ / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2-I ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධාරියා හෝ ඔහු විසින් බලය පවරන ලද තැනැත්තෙකු විසින් සිදු කරනු ලැබේ.
("ඇ" පරිශිෂ්ඨය උපයෝගි කර ගත යුතුය)

14.1.5.2 අභියෝග්‍යතා පරීක්ෂණය සමත්වීම යටතේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයක ප්‍රතිපල මත ඉන් සමත් වන්නන් විසින් විදුහල්පති මගින් කොට්ඨාශ / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2-I ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධාරියා හෝ ඔහු විසින් බලය පවරන ලද තැනැත්තෙකු විසින් සිදු කරනු ලැබේ.
("ඇ" පරිශිෂ්ඨය උපයෝගි කර ගත යුතුය)

14.2 **2-I ශ්‍රේණියේ සිට 1 පන්තියට උසස් කිරීම (සියලුම ගුරුවරුන්)**

14.2.1 **පූර්ව අවශ්‍යතා**

I. උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනට 2-I ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

II. දෙවන කාර්යක්ෂමතා කඩඉම වශයෙන් දේශන පැය 240 කට හෝ මාස තුනකට නො අඩු දෙවන සේවාස්ථ පුහුණුව 2-I ශ්‍රේණියේ වසර හය (06) ක සේවා කාලයක් අවසන්වීමට පෙර සම්පූර්ණ කර තිබීම.

III. වෘත්තිය සමාලෝචනය ද ඇතුලුව අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) ක් තුළ සතුටුදායක කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වූ වසර පහ (05) ක් තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

14.2.2 **උසස් කිරීමේ ක්‍රමය**

සුදුසුකම් සම්පූර්ණ කරන ගුරුවරුන් 1 පන්තියට උසස් කිරීම සඳහා විදුහල්පති මගින් කොට්ඨාශ / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 1 පන්තියට උසස් කිරීම පත්වීම් බලධාරියා හෝ ඔහු විසින් බලය පවරන ලද තැනැත්තෙකු විසින් සිදු කරනු ලැබේ. ("ඇ" පරිශිෂ්ඨය උපයෝගී කර ගත යුතුය)

15. **අන්තර්කාලීන විධිවිධාන**

ඉහත සඳහන් පරිදි ශික්ෂණ විද්‍යාත්මකව පුහුණුව ලද උපාධිධාරීන් පමණක් බඳවා ගැනීම සඳහා අවශ්‍යවන ආයතනික පහසුකම් සම්පූර්ණයෙන් සැලසෙන තෙක් අන්තර්කාලීන පන්තියක් පහත සඳහන් පරිදි පවත්වා ගෙන යනු ලැබේ.

15.1 **බඳවා ගන්නා ශ්‍රේණිය**

| | |
|---|---|
| 4.7 ඡේදයේ සඳහන් උපාධිධාරීන් | -3 පන්තිය-I (අ) ශ්‍රේණිය |
| 4.9 ඡේදයේ සඳහන් ගුරු පුහුණුව ලත් තැනැත්තන් | -3 පන්තිය-I (ආ) ශ්‍රේණිය |
| 4.11 ඡේදයේ සඳහන් ඩිප්ලෝමාධාරීන් | -3 පන්තිය-I (ඇ) ශ්‍රේණිය |
| 4.13 ඡේදයේ සඳහන් අ.පො.ස. (උසස් පෙළ) සුදුසුකම් ලත් තැනැත්තන් | -3 පන්තිය - II ශ්‍රේණිය |

15.2 **අන්තර්කාලීන විධිවිධාන යටතේ බඳවා ගැනීම්**

අන්තර්කාලීන ශ්‍රේණි සඳහා බඳවා ගැනීම සිදුකළ හැක්කේ 11.1 හි සඳහන් සේවක සංඛ්‍යාව තුළ ඇති වන පුරප්පාඩු සඳහා 12.2.1.1 ඡේදයෙහි විධි විධාන යටතේ සුදුසුකම් ලද තැනැත්තන් බඳවා ගැනීමට නොහැකි වන අවස්ථාවකදී පමණි. කෙසේ වතුදු අන්තර්කාලීන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීම මෙම සේවා ව්‍යවස්ථාව ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කරනු ලබන දින සිට වසර පහ (05) කට සීමා විය යුතු අතර එම කාලය අවසානයේ පවත්නා තත්වය සළකා එම කාලය දීර්ඝ කිරීම ගැන සළකා බැලිය හැකිය.

15.3 **සුදුසුකම්:**

15.3.1 **අධ්‍යාපන සුදුසුකම්**

**(අ) 3 පන්තිය - I (අ) ශ්‍රේණිය**

i. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් එක් වරකදී මව් භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් පහක් (05) සහිතව දෙවාරයකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 ක්

සමත්වීම හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් අ.පො.ස. (සා.පෙළ) හා සම තත්ත්වයේ සලකනු ලබන සුදුසුකමක් ලබා තිබීම ද .

ii. අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් විෂයයන් **03** කින් සමත් වීම

iii. 4.7 හි සඳහන් උපාධි සුදුසුකම් ලබා තිබීම.

**(ආ) 3 පන්තිය - I (ආ) ශ්‍රේණිය**

i. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් මව් භාෂාව හා ගණිතය ඇතුලුව එක් වරකදී විෂයයන් පහක් **(05)** සහිතව දෙවාරයකට නොවැඩි වාරයකදී විෂයයන් හයක් **(06)** ක් සමත්වීම හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් අ.පො.ස. (සා.පෙළ) හා සම තත්ත්වයේ සලකනු ලබන සුදුසුකමක් ලබා තිබීම ද.

ii. අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් විෂයයන් **03** කින් සමත් ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම ද.

iii. 4.9 හි සඳහන් ගුරු පුහුණු සුදුසුකම ලබා තිබීම

**(ඇ) ) 3 පන්තිය - I (ඇ) ශ්‍රේණිය**

i. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් මව් භාෂාව හා ගණිතය ඇතුළුව එක් වරකදී විෂයයන් පහක් **(05)**ක් සහිතව දෙවාරයකට නොවැඩි වාර ගණකදී විෂයයන් හයක් **(06)** සමත්වීම හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් අ.පො.ස. (සා.පෙළ) හා සම තත්ත්වයේ සලකනු ලබන සුදුසුකමක් ලබා තිබීම ද.

ii. අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් විෂයයන් **03** කින් සමත් වීම.

සමග

iii. 4.11 හි සඳහන් ඩිප්ලෝමා සුදුසුකම් ලබා තිබීම.

**(ඇ) ) 3 පන්තිය - II ශ්‍රේණිය**

i. අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක් වරකදී මව් භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් **06** කින් සම්මාන **03** ක් සහිතව සමත්වීම හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් අ.පො.ස. (සා.පෙළ) හා සම තත්ත්වයේ සලකනු ලබන සුදුසුකමක් ලබා තිබීම ද.

සමග

ii. අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් විෂයයන් **03** කින් සමත් ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම.

**15.4 වෘත්තීය සුදුසුකම්** : අදාළ නොවේ

**15.5 පළපුරුද්ද** : අදාළ නොවේ

**15.6 කායික සුදුසුකම්** :

I. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

II. තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**15.7 වෙනත්**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම හා පළාත් රාජ්‍ය සේවය පිළිබඳ අදාළ පළාත් සභා බල ප්‍රදේශය තුළ නියම කරනු ලබන කාලයක් ස්ථිර පදිංචි කරුවෙකු වීම. අවශ්‍ය අවස්ථාවලදී පත්වීම් බලධාරියාට මෙම විධිවිධාන නොසලකා ක්‍රියා කළ හැක.

II. අයැදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම

III. රාජ්‍ය සේවයෙන් පහකළ අයෙකු හෝ රාජ්‍ය සේවය අවසන් කළ අයෙකු හෝ රාජ්‍ය සේවයේ තනතුර හැර ගිය අයෙකු නොවීම.

IV. සුදුසුකම් ලබන දිනය - ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට / සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයැදුම්කරු, ඉහත 12.2.1.1 වන ඡේදයේ සඳහන් අවශ්‍ය සුදුසුකම් අයැදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයැදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

**15.8 වයසඃ**

15.8.1 **අවම සීමාව** : අවුරුදු 18

15.8.2 **උපරිම සීමාව** : අවුරුදු **35**

**15.9 බඳවා ගැනීමේ ක්‍රමය** :

සේවයට බඳවා ගැනීමේදී පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන පරිදි, ඒ වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තරග විභාගයක හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හෝ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මත බඳවා ගනු ලැබේ.

**15.9.1 ලිඛිත විභාගය :** **( 'අ' පරිශිෂ්ඨය බලන්න)**

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය (අවම) |
|---|---|---|
| අභියෝග්‍යතාව (කාලය පැය 01යි) | 100 යි | 40 යි |
| සාමාන්‍ය දැනීම (කාලය පැය 01යි) | 100 යි | 40 යි |

15.9.1.1 **පවත්වන බලධරයා :** විභාග කොමසාරිස් ජනරාල්

15.9.2 **වෘත්තීය පරීක්ෂණය:** අදාළ නොවේ

15.9.2.1 **පවත්වන බලධරයා :** අදාළ නොවේ

15.9.3 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :** ලකුණු ලබා දෙනු ලැබේ

**ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු:**

මෙහිදී තමන් අයැදුම් කරන විෂය ක්ෂේත්‍රයට අදාළව ඉගැන්වීමේ කුසලතාව පරීක්ෂා කරන අතර ඒ සඳහා ලකුණු 50 ක් පිරිනැමේ.

15.9.3.1 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය**

**පත්කරන බලධරයා :** පත්වීම් බලධාරියාම වේ

15.9.4. **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:** ලකුණු ලබා දෙනු නොලැබේ

**ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු:**

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

15.9.4.1 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය**

**පත්කිරීමේ බලධරයා:** පත්වීම් බලධාරියාම වේ

**සටහන:**

සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අයැදුම්කරුවන් සංඛ්‍යාව, අවස්ථාවෝචිත පරිදි ලිඛිත විභාගයේදී ඔවුන් විසින් ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ හා අදාළ පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. තෝරාගැනීම 'අ' පරිශිෂ්ඨය අනුව සිදු කරනු ලැබේ.

15.10 **අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :** රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම මගින් හෝ රජයේ පුවත්පත් දැන්වීමක් මගින්

15.11 අන්තර්කාලීන ශ්‍රේණි සඳහා වැටුප

15.11.1 වැටුප් කේත අංකයඃ ජී. ඊ. 1-2006

15.11.2 වැටුප් පරිමාණයඃ රු.13,410-145 x 6-180 x 7-215 x 1-15,755

15.11.3 ශ්‍රේණි ක්‍රමය හා අදාළ ආරම්භක වැටුප් පියවරඃ

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය |
|---|---|---|
| 3 පන්තිය - II ශ්‍රේණිය | පියවර 01 | රු. 13,410/- |
| 3 පන්තිය - I (ඇ) ශ්‍රේණිය | පියවර 07 | රු. 14,280/- |
| 3 පන්තිය - I (ආ) ශ්‍රේණිය | පියවර 09 | රු. 14,640/- |
| 3 පන්තිය - I (අ) ශ්‍රේණිය | පියවර 14 | රු. 15,540/- |

සටහන :

3 පන්තියේ II ශ්‍රේණියේ සිට එම පන්තියේ ඉහළ ශ්‍රේණියකට පත් කරනු නොලැබුවහොත් 3 පන්තියේ I ශ්‍රේණියකට හෝ ඊට ඉහළ පන්ති/ශ්‍රේණිවලට හිමි වැටුප් පරිමාණ / වැටුප් පියවර සඳහා හිමිකම් නො ලැබෙන අතර, අංක 06/2006(viii) වැටුප් වගුවල 3-II ශ්‍රේණියට අදාළව දැක්වෙන ඊලඟ ශ්‍රේණියට / පන්තියට උසස් නොවුනේ නම් නියම කර ඇති අවසන් වැටුප් පියවර දක්වා පමණක් එම වැටුප් පරිමාණය ක්‍රියාත්මක සේ සැලකේ.

15.12 අන්තර්කාලීන ශ්‍රේණිවල සිට උසස් කිරීම් / පත් කිරීම්

15.12.1 (අ) සේවයේ 3-II ශ්‍රේණියේ සිට 3-I ශ්‍රේණියට හෝ 2-II ශ්‍රේණියට පත් කිරීම.

(i) විධිමත් පරිදි උපාධි සුදුසුකම් ලබා ගත් විට 3-I (අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ii) ගුරු පුහුණුව සම්පූර්ණ කළ විට 3-I (ආ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(iii) 2-II ශ්‍රේණියට පත් කිරීම සඳහා අවශ්‍ය ඉහත 12.2.1.1 හි සඳහන් සුදුසුකම් ලබා ගතහොත් 2-II ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ආ) සේවයේ 3-I(ඇ) සිට ඉහළ ශ්‍රේණිවලට පත් කිරීම හෝ 2-II ශ්‍රේණියට පත් කිරීම/උසස් කිරීම

(1) සේවයේ 3-I (ඇ) ශ්‍රේණියේ පත්වීම් ලද ගුරුවරුන් ඉහළ ශ්‍රේණිවලට පත් කිරීම හෝ 2-II ශ්‍රේණියට උසස් කිරීම

(i) උපාධි සුදුසුකම් ලබා ගත් විට 3-I (අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ii) ගුරු පුහුණුව සම්පූර්ණ කළ පසු 3-I (ආ) ශ්‍රේණියට පත් කරනු ලැබේ

(iii) 2-II ශ්‍රේණියට පත් කිරීම සඳහා අවශ්‍ය ඉහත 12.2.1.1 හි සඳහන් සුදුසුකම් ලබා ගතහොත් 2-II ශ්‍රේණියට පත් කරනු ලැබේ.

**(2) 3-I (ඇ) ශ්‍රේණියේ සිට 2-II ශ්‍රේණියට උසස් කිරීම පූර්ව අවශ්‍යතා**

(i) උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනට 3-I ශ්‍රේණියේ අවම වශයෙන් වසර හත (07) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ii) කාර්යක්ෂමතා කඩඉම වශයෙන් දේශන පැය 280 කට හෝ මාස තුනකට නො අඩු දෙවන සේවාස්ථ පුහුණුව 3-I (ඇ) ශ්‍රේණියේ වසර හත (07) ක සේවා කාලය අවසන්වීමට පෙර සම්පූර්ණ කර තිබීම.

(iii) වෘත්තිය සමාලෝචනය ද ඇතුලුව අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර හත (07) තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම හා සේවය සතුටුදායකව තිබීම.

(iv) උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වූ වසර පහ (05) තුළ සේවය සතුටුදායකව තිබීම.

**(ඇ) සේවයේ 3-I (ආ) ශ්‍රේණියේ සිට 2-II ශ්‍රේණියට උසස් කිරීම පූර්ව අවශ්‍යතා**

(i) උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනට 3-I (ආ) ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ii) කාර්යක්ෂමතා කඩඉම වශයෙන් දේශන පැය 200 කට හෝ මාස තුනකට නො අඩු දෙවන සේවාස්ථ පුහුණුව 3-I (ආ) ශ්‍රේණියේ වසර පහ (05) ක සේවා කාලය අවසන් වීමට පෙර සම්පූර්ණ කර තිබීම.

(iii) වෘත්තිය සමාලෝචනය ද ඇතුලුව අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම හා සේවය සතුටුදායකව තිබීම.

(iv) උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වූ වසර පහ (05) තුළ සේවය සතුටුදායකව තිබීම.

**සටහන:**

2-II ශ්‍රේණියට පත් කිරීමේ සුදුසුකම් (උපාධිය සමත්විට) ලබා ගතහොත් ඒ අනුව එම ශ්‍රේණියට පත් කරනු ලැබිය හැක.

**(ඇ) සේවයේ 3-I(අ) ශ්‍රේණියේ සිට 2-II ශ්‍රේණියට උසස් කිරීම**
**පූර්ව අවශ්‍යතා**

(i) උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනට 3-I (අ) ශ්‍රේණියේ අවම වශයෙන් වසර දෙක (02) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ii) කාර්යක්ෂමතා කඩඉම වශයෙන් දේශන පැය 80 කට හෝ මාස තුනකට නො අඩු සේවාස්ථ පුහුණුවක් 3-I (අ) ශ්‍රේණියේ වසර දෙක (02) ක සේවා කාලය අවසන්වීමට පෙර සම්පූර්ණ කර තිබීම.

(iii) වෘත්තිය සමාලෝචනය ද ඇතුලුව අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර දෙක (02) තුළ සතුටුදායක කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම හා සේවය සතුටුදායකව තිබීම.

(iv) උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වූ වසර දෙක (02) තුළ සේවය සතුටුදායකව තිබීම.

**(ඉ) සේවයේ 3-I (අ) ශ්‍රේණියේ ගුරුවරුන් 2-II ශ්‍රේණියට පත් කිරීම**

අධ්‍යාපන විෂයයට අදාළව පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගත් විට 2-II ශ්‍රේණියට පත් කරනු ලැබේ.

15.12.2 ඉහත සුදුසුකම් කිසිවක් අත් පත් කර නොගතහොත් 3-II ශ්‍රේණියට බඳවා ගත් තැනැත්තන් හට පී.ථ් 1-2006 වැටුප් පරිමාණයේ 3-II ශ්‍රේණියට අදාළව දැක්වෙන, ඊළග ශ්‍රේණියට උසස් නොවූයේ නම් නියම කර ඇති අවසන් වැටුප් පියවර දක්වා පමණක් ක්‍රියාත්මක සේ සැළකේ.

15.12.3 **උසස් කිරීමේ ක්‍රමය**

සුදුසුකම් සම්පූර්ණ කරන ගුරුවරුන් අදාළ ශ්‍රේණියට උසස් කිරීම/ පත් කිරීම සඳහා විදුහල්පති මගින් කොට්ඨාශ / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධාරියා හෝ ඔහු විසින් බලය පවරන ලද තැනැත්තෙකු විසින් සිදු කරනු ලැබේ. ("ඇ" පරිශිෂ්ඨය උපයෝගි කර ගත යුතුය)

15.12.4 සේවයේ 3-1 ශ්‍රේණියේ සිට 2-II ශ්‍රේණියට පත් කිරීමට අදාළව පිහිටුවිය යුතු වැටුප් පියවර

(අ) සේවයේ 3-I ඇ, 3-I ආ, හෝ 3-I අ, ශ්‍රේණිවල සිට 2-II ශ්‍රේණියට පත්කිරීමේදී 2-II ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරෙහි පිහිටුවනු ලැබේ.

(ආ) සේවයේ 3-I ශ්‍රේණියට බඳවා ගත් පුහුණු ගුරුවරු, උපාධි සුදුසුකම් ලබාගත් විට 2-II ශ්‍රේණියට බඳවා ගැනීමෙන් පසු එම ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ 2 වන පියවරෙහි පිහිටුවනු ලබති.

(ඇ) සේවයේ 3-I ශ්‍රේණියට බඳවාගත් ශික්ෂණ විද්‍යාත්මක පුහුණුව නොලද උපාධිධාරීහු පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සුදුසුකම් ලබා ගත් විට 2-II ශ්‍රේණියට බඳවා ගැනීමෙන් පසු එම වැටුප් පරිමාණයේ 3 වන පියවරෙහි පිහිටුවනු ලබති.

(ඈ) සේවයේ 3-I ශ්‍රේණියට බඳවා ගැනීමෙන් පසු ප්‍රථම උපාධියට අමතරව පශ්චාත් උපාධියක් සහිත පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සුදුසුකම් ලත් ගුරුවරු 2-II ශ්‍රේණියට බඳවා ගැනීමෙන් පසු එම වැටුප් පරිමාණයේ 4 වන පියවරෙහි පිහිටුවනු ලබති.

**සටහන:**
**එක් පන්තියක / ශ්‍රේණියක සිට ඊළඟ ඉහළ පන්තියට/ ශ්‍රේණියට උසස් කිරීමට අදාළව වැටුප් පරිවර්තනය ආයතන සංග්‍රහයේ vii:5 විධිවිධාන සංශෝධනය කරමින් නිකුත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 11/94 හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2000 විධිවාධන යටතේද සිදු කළ යුතුය.**

## 16. සේවයට අන්තර්ග්‍රහණය කිරීම

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීම පහත දැක්වෙන පරිදි සිදු කළ යුතුය.

16.1 (අ) වර්තමාන ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-II ශ්‍රේණියේ සිටින පත්වීමට අදාළව නියම කර ඇති අධ්‍යාපන සුදුසුකම් සහිත ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-II ශ්‍රේණියට ද,

(ආ) වර්තමාන ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I ශ්‍රේණියේ සිටින ඩිප්ලෝමාධාරී (නුපුහුණු) සුදුසුකම් සහිත ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (ඇ) ශ්‍රේණියට ද,

(ඇ) වර්තමාන ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I ශ්‍රේණියේ සිටින පුහුණු ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (ආ) ශ්‍රේණියට ද,

(ඈ) වර්තමාන ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I ශ්‍රේණියේ සිටින උපාධිධාරී (වෘත්තීය පුහුණු සුදුසුකම් රහිත) ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට ද,

(ඉ) වර්තමාන ශ්‍රී ලංකා ගුරු සේවයේ 2-II ශ්‍රේණියේ සිටින ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2-II ශ්‍රේණියට ද,

(ඊ) වර්තමාන ශ්‍රී ලංකා ගුරු සේවයේ 2-I ශ්‍රේණියේ සිටින ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2-I ශ්‍රේණියට ද,

(උ) වර්තමාන ශ්‍රී ලංකා ගුරු සේවයේ 1 වන පන්තියේ සිටින ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 1 වන පන්තියට ද,

අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

16.2 අන්තර්ග්‍රහණය කිරීම මත වැටුප් පරිවර්තනය කිරීම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(VIII) උපලේඛ II සඳහන් පරිවර්තන වගුව යටතේ සිදු කළ යුතු අන්තර්ග්‍රහණය හේතු කොට ගෙන වැටුප් වර්ධක දිනයේ වෙනසක් සිදු නොවේ.

17. **වෙනත් කොන්දේසි / විධිවිධාන**

17.1 සේවය සඳහා කෙරෙන සියලු පත්වීම් පහත සඳහන් කොන්දේසියට යටත් වේ.

